# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2208/5 – 2020 දෙසැම්බර් 28 වැනි සඳුදා – 2020.12.28**

**(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)**


# I වැනි කොටස: (I) වැනි ඡේදය – සාමාන්‍ය

## රජයේ නිවේදන

මගේ අංකය: IR/21/45/2011.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2014.01.02 දිනැති හා අංක 1843/30 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2013.12.23 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් කොළඹ 10, ටී. බී. ජයා මාවත, අංක 493/1 හි පදිංචි ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය, පිටකෝට්ටේ, කෝට්ටේ පාර, අංක 416 හි පිහිටි ජාතික සේවක සංගමය සහ අතුරුගිරිය, ඔරුවල හි පිහිටි සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2020.09.11 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ඔක්තෝබර් මස 14 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.




*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

යොමු අංකය: IR/21/45/2011.

කාර්මික අධිකරණයේ දී ය

*එක් පාර්ශවයක් වශයෙන්,*

(ශ්‍රී ලංකා නිදහස් සේවක සංගමය)

1. ආර්. ඩබ්. නිමල් ජයසිරි
2. ඩබ්. එම්. සුනිල් පෙරේරා
3. පී. ගීතාංජනී ප්‍රනාන්දු
4. එල්. ඩී. එන්. විමලසිරි
5. එම්. ඒ. සුනනදාස
6. ජී. පී. සී. පීරිස්
7. ජී. ඩී. ඒ. එස්. විනෝදනී
8. එම්. යූ. කොස්තා
9. එල්. ආර්. ඩබ්. එස්. රූපසිංහ
10. එන්. ආර්. ඩී. ද සිරිමාන්න
11. ඩී. ජී. එම්. මාරසිංහ
12. එච්. ජී. පී. අරුණශාන්ත
13. ඒ. බී. රත්නායක
14. එස්. විජේමාන්න
15. ඩබ්. එල්. කිත්සිරි
16. සී. රතිරගේ
17. එන්. කේ. විතානගේ
18. එච්. ටී. ලීලානන්ද
19. ඩී. පී. කේ. පී. ජයවීර
20. එල්. ඩී. පී. එල්. ජයසේකර
21. එස්. මාතරආරච්චිගේ
22. කේ. ඒ. පද්මසිරි
23. ජී. ජයරත්න
24. ආර්. ඒ. ස්වර්ණසිරි පෙරේරා
25. ටී. ජේ. යූ. සමරසිංහ
26. එච්. බී. එන්. කුමාරවංශ
27. බී. ඒ. ඩී. පද්මසිරි
28. ඒ. එම්. සේනාරත්න
29. සී. වීරසේන
30. පී. ඩී. සුමිත් දම්මික
31. යූ. ඒ. ඒ. ජේ. අමරසිංහ
32. ජී. ප්‍රේමසිරි
33. ඒ. වී. ඒ. ශාන්ත

A - 3533

34. එස්. එල්. ඩී. කරුණාදාස
35. ඩබ්. කේ. විජිත
36. පී. තලගල
37. අයි. එස්. විජේසිංහ
38. එල්. පී. නිහාල් ප්‍රේමසිරි
39. එච්. ඒ. ගාමිණී පෙරේරා
40. පී. කරුණාසේන
41. ඩී. පියදාස
42. කේ. කේ. ඉන්ද්‍රා මල්ලිකා
43. සී. ඩී. මල්ලිකාරච්චි
44. ජේ. ඒ. ජේ. කේ. ජයසූරිය
45. ඩී. එම්. එස්. සෙනෙරත්
46. කේ. එම්. සමන්
47. එම්. ඒ. සී. ඩී. පෙරේරා
48. කේ. එන්. රතන්සිරි
49. සමරසිරි උලපනේ
50. එම්. ඒ. ආර්. එස්. විජේනායක
51. ටී. ඩී. වසන්ත කුමාර
52. වයි. එස්. ද සිල්වා
53. එස්. ආර්. සී. ඩබ්. කාන්ත පෙරේරා
54. පී. එම්. ඒ. කුලසිංහ
55. සී. පී. බුලත්සිංහල
56. ඩබ්. ඩී. යූ. නිරෝෂ්
57. ජී. ටී. ප්‍රියන්ත
58. එල්. ජී. එම්. අයි. ද සිල්වා
59. අයි. ආර්. දහනායක
60. අයි. ටී. දහනායක
61. ආර්. ඊ. එල්. ද සිල්වා
62. ඩබ්. ඒ. එස්. පී. ප්‍රනාන්දු
63. එම්. එම්. එම්. එන්. නරසිංහ
64. එස්. පී. ඩී. එම්. එම්. සේනාධීර
65. එස්. වසන්ත කුමාර
66. ආර්. ඒ. පී. ආර්. ගුණවර්ධන
67. ඒ. එච්. එල්. එල්. ප්‍රියදර්ශන
68. ඩබ්. ඒ' පී. කුලතිලක
69. ඩබ්. එස්. තලගල

70. බී. ඒ. සී. අමරජීව
71. එච්. ඩී. පී. නිශාන්ත
72. ඒ. කේ. පී. අල්ගෙවත්ත
73. එච්. ඩී. අබේගුණසේකර
74. එම්. ශාන්ත කුමාර
75. ජේ. ඒ. එස්. ඩී. නන්දසිරි
76. අයි. පී. වාලිත
77. කේ. ඒ. ඩී. මහින්ද
78. එම්. ටී. පී. කුමාර
79. එස්. ඒ. ජේ. ලක්මාල්
80. එම්. ඩී. සුමතිපාල
81. ආර්. එම්. ධර්මරත්න
82. යූ. සී. ඇල්විටිගල
83. කේ. බී. ඒ. එස්. ඩබ්. අල්විස්
84. එස්. එන්. හෙට්ටිආරච්චි
85. ඒ. එච්. එල්. එච්. නිලුපුල්
86. එම්. එන්. කේ. පෙරේරා
87. එම්. එස්. පෙරේරා
88. එම්. ඒ. කේ. පෙරේරා
89. පී. ඒ. ඩී. ගුණරත්න
90. පී. ජී. සී. ජයරුවන් පැලදාගම
91. ඩී. විරාජ් මංජුල

(ජාතික සේවක සංගමය)

1. එම්. ඒ. සරත්
2. ඩී. ඩී. සරත්
3. ඩී. යූ. නානායක්කාර
4. කේ. බී. එස්. විජේනායක
5. එස්. පොරවගමගේ
6. ඩී. ඒ. ඩී. ප්‍රේමලාල්
7. එම්. සිරිසේන
8. පී. එල්. ටී. රණසිංහ
9. එච්. දෙනවක
10. එල්. ඩී. එන්. ජයසිංහ
11. එම්. එම්. චන්ද්‍රාතිලක
12. ජී. කලුබෝවිල
13. කේ. කේ. රංජිත් සුනිල්
14. එස්. පී. පද්මසිරි
15. කේ. ඒ. එස්. කේ. පෙරේරා

16. කේ. ඒ. එම්. විමලසේන
17. කේ. එන්. පෙරේරා
18. බී. ජයතිලක
19. කේ. රත්නපාල
20. ඒ. ඒ. ආනන්ද සරත්
21. ඩබ්. කේ. පී. එස්. ඩී. ආර්. ගුණවර්ධන
22. ඒ. ඩී. අනුර
23. කේ. අයි. ජයරත්න
24. ජී. ජී. එස්. චන්ද්‍රසිරි
25. ඩී. එන්. විජේතුංග
26. එම්. එච්. සරත්
27. එන්. එල්. පෙරේරා
28. එන්. කේ. ඩී. ඩී. රංජිත්
29. එම්. කේ. චිත්‍රානන්ද
30. කේ. ඒ. ඩී. පන්නල
31. ජී. ජී. ජගත් හේමචන්ද්‍ර
32. පී. එස්. සේනාධීර
33. පී. එස්. සී. සේනාධීර
34. පී. සරත් පුෂ්පකුමාර
35. කේ. ඒ. ඩී. කිත්සිරි
36. එස්. ඩී. චන්ද්‍රදාස
37. එච්. ඒ. පී. කේ. ජයසේකර
38. ඩබ්. එම්. චන්ද්‍රලාල්
39. ටී. ඒ. ඩී. ඩබ්. පී. ජයතිලක
40. පී. සී. පෙරේරා
41. එන්. එම්. කරුණානන්ද
42. ඕ. ඒ. සුනිල්
43. ආර්. ඒ. කරුණාසේන
44. සී. එස්. කුමාරගේ
45. ඒ. නන්දසිරි
46. වී. එන්. රෝහණ විතාන
47. බී. විජයවර්ධන
48. එම්. එල්. ජයසිරි
49. ඩබ්. කේ. ඒ. සේනක සිරිලාල්
50. ආර්. ඒ. යසරත්න
51. එස්. ඒ. ජයතිලක
52. කේ. ඩී. ජයසේන
53. කේ. පී. ගාමිණී චන්ද්‍රසිරි
54. කේ. ටී. විල්සන් තිලකරත්න
55. එච්. ඩී. එස්. සමන්ත

56. ඩබ්. ඒ. සුජීව
57. එම්. කේ. ඒ. දර්ශන
58. එන්. එස්. ධර්මප්‍රිය
59. කේ. ඩී. සී ද සිල්වා
60. ඊ. එන්. ඒ. සමරකෝන්
61. කේ. ඩී. ඩබ්. ආරියවංශ
62. ජේ. ඒ. එස්. යූ. කුමාර
63. එස්. බී. සී. අනුරුද්ධ
64. එස්. ඒ. කිංස්ලි සමන්ත
65. ඒ. ඩබ්. ජේ. දේවප්‍රිය පෙරේරා
66. ඩී. ඩී. කේ. රත්කොත්ගේ
67. වයි. ඒ. එස්. ඉන්දික
68. එම්. ටී. ඩබ්. කුමාර
69. ඩබ්. ඒ. එන්. ජී. කුරේ
70. කේ. ජී. පෙරේරා
71. පී. ඒ. පී. කුමාරසිරි පෙරේරා
72. එස්. පී. ජී. චන්ද්‍රකුමාර
73. සී. ආර්. කොළඹගේ
74. බී. ලසන්ත සම්පත්
75. එස්. මායාදුන්න
76. එස්. කේ. වැලිකල
77. ආර්. කේ. කොටිගල
78. ඩබ්. ඩී. පී. කරුණාරත්න
79. ඒ. එච්. එල්. එස්. එස්. කුමාර
80. පී. ඩී. කරුණාරත්න
81. ඩබ්. ඩී. සී. කේ. විතාන
82. ඩී. කේ. එස්. වනිගතුංග
83. කේ. ඒ. ඩී. සී. ජගදීස
84. ජී. ටී. නදික
85. ඩී. අයි. කේ. දහනායක
86. එස්. පී. වානගුරු
87. ටී. පී. කේ. තලගල
88. ටී. ජේ. චතුරංග
89. එච්. එස්. සමන් කුමාර
90. ජී. වී. ඩී. අරුණ ප්‍රියංකර

ඇතුළු සේවකයන් 181

සහ

*අනෙක් පාර්ශවය වශයෙන්,*

සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ්,
ඔරුවල,
අතුරුගිරිය.

ප්‍රදානය

කම්කරු හා කම්කරු සබඳතා අමාත්‍ය ගාමිණී ලොකුගේ මහතා විසින් වර්ෂ 1957 අංක 14 සහ 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමග කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහුට පැවරී ඇති බලතල අනුව, ඉහත සඳහන් පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරවුල බේරුම් කිරීමෙන් සමථයට පත්කිරීම සඳහා බේරුම්කරුවකු ලෙස 2013.12.23 දින මා පත්කොට මා වෙත යොමු කර ඇත.

ඉහත සඳහන් පාර්ශවයන් අතර පවතින ආරවුල මෙසේය. ''සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් විසින් මේ සමග අමුණා ඇති උපලේඛනයේ නම් සඳහන් ආර්. ඩබ්. නිමල් ජයසිරි මහතා ඇතුළු සේවකයන් 181 දෙනෙකු වෙත 2009 වසරේ සිට වාර්ෂික මුදල් නොගෙවීමෙන් ඔවුන්ට අසාධාරණයක් සිදු වී ඇත්ද, එසේ සිදු වී ඇත්නම් ඔවුන් වෙත ලැබිය යුතු සහන කවරේ ද?'' යන්න පිළිබඳව වේ.

ප්‍රථම පාර්ශවය ඉහත ආරවුල සම්බන්ධයෙන් ප්‍රථම ප්‍රකාශය ගොනු කිරීමෙන් අනතුරුව දෙවන පාර්ශවය ද පිළිතුරු ප්‍රකාශයක් ගොනු කිරීමෙන් පසුව ප්‍රථම පාර්ශවය ප්‍රතිඋත්තර ප්‍රකාශයක් ද ගොනු කර තිබිණි.

ඉහත පිළිතුරු ප්‍රකාශ, ප්‍රතිඋත්තර ප්‍රකාශය ගොනු කිරීමෙන් අනතුරුව දෙවන පාර්ශවය මූලික විරෝධතාවයක් ඉදිරිපත් කරමින් මෙම ආරවුල කම්කරු දෙපාර්තමේන්තුවට යොමු කිරීමට ප්‍රථම ආයෝජනය මණ්ඩල පනතේ ප්‍රකාරව ආයෝජන මණ්ඩලයට පැමිණිලි කළ යුතු බවද එසේ නොකිරීම මත මෙම ආරවුල පවත්වා ගෙන යා නොහැකි බවට දැනුම් දීම මත දෙපාර්ශවයට ඊට අදාළව කරුණු ඉදිරිපත් කිරීමට අවස්ථාවක් ලබාදෙන ලදී.

එකී විරෝධතාවය මත නියෝගයක් ලබා දෙමින් දෙවන පාර්ශවයට එම ස්ථාවරය සාක්ෂි මගින් තහවුරු කරන ලෙස දැනුම් දෙන ලදී.

දෙවන පාර්ශවය ඉහත නියෝගය පරිදි සාක්ෂි විමසීමක් නොකොට පළමු පාර්ශවයට සාමාන්‍ය පරිදි සාක්ෂි මෙහෙයවීම ආරම්භ කරන ලෙස ද ඉහත විරෝධතාවය මතු කිරීමේ අවකාශය තබා ගනිමින් පළමු පාර්ශවයට ප්‍රථමයෙන් සාක්ෂි ඉදිරිපත් කරන ලෙස දැනුම්දෙන ලදී. ඊට එකඟවීම මත පළමු පාර්ශවය සාක්ෂි මෙහෙයවීම ආරම්භ කරන ලදී.

පළමු පාර්ශවය සාක්ෂි මෙහෙයවීම ආරම්භ කරමින් ජාතික සේවක සංගමයේ සභාපති වන ආර්. ඒ. යසරත්න නැමැති සේවකයා ප්‍රථමයෙන් සාක්ෂියට කැඳවන ලදී.

ඉහත සාක්ෂිකරු කරුණු ඉදිරිපත් කරමින් අවුරුදු 27ක් ආයතනයේ සේවය කළ බව ද ඒ අනුව 1980 සිට සේවය කළ බව ද අදාළ කාලය තුළ ප්‍රසාද දීමනාව ලබා ගත් බව ද පසුව මෙම ආයතන කොරියන් සමාගමට පැවරීමෙන් පසුව ද අදාළ ප්‍රසාද දීමනාව ගෙවූ බව ද ඉහත ප්‍රසාද දීමනාව ගිවිසුම් ගත ව පවතින බව ද වර්තමාන සමාගම මෙම ආයතනය ගැනීමෙන් අනතුරුව ගිවිසුම්ගතව තිබූ ප්‍රසාද දීමනාව ලබා නොදුන් බව ද ඒ අනුව එකී ප්‍රසාද දීමනාව ලබාදෙන ලෙස සිය කරුණු ඉදිරිපත් කරමින් ඉල්ලා ඇත.

ඉහත සාක්ෂිකරු සාක්ෂියට කැඳවීමෙන් අනතුරුව එම්. ඒ. සුනිල් නැමැති සේවකයා සාක්ෂියට කැඳවන ලදී. ඉහත සාක්ෂිකරු ද 1980 වර්ෂයේ සිට ආධුනික පුහුණුකරුවෙකු ලෙස සේවයට බැඳී 1983 සිට 2014 දක්වා සේවය කළ බව ද තමාට ද ප්‍රසාද දීමනාව ගෙවූ බව ද ඊට

අදාළ වැටුප් පත් A 12(a) සිට A 12(s) දක්වා ලකුණු කරමින් කරුණු ඉදිරිපත් කර තිබිණි. වර්තමාන සේවායෝජකයා ඉහත ප්‍රසාද දීමනාව නොගෙවූ බව මෙම ඉල්ලුම්කරු ද සඳහන් කර තිබිණි.

ඉහත සාක්ෂිකරු සාක්ෂියට කැඳවීමෙන් අනතුරුව පළමු පාර්ශවය සාක්ෂි මෙහෙයවීම අවසන් කර ඇත.

දෙවන පාර්ශවය හෙවත් වගඋත්තරකරු සාක්ෂි මෙහෙයවීම ආරම්භ කරමින් නිහාල් අබේවික්‍රම වන නියෝජ්‍ය මුදල් කළමනාකරු සාක්ෂියට කැඳවන ලදී.

ඉහත සාක්ෂිකරු සංස්ථාව කාලයේ නොසිටි බව ද වානේ සංස්ථාව සමාගමක් බවට පත් වූ පසුව සේවයට පැමිණි බව ද ඉන්පසුව වර්තමාන සමාගම යටතේ ද සේවය කරන බව ද තමා සේවය කරමින් සිටියදී කොරියන් හෙවි ඉන්ඩස්ට්‍රීස් කන්ස්ට්‍රක්ෂන් (Construction) සමාගමට පැවරුණ බව ද ඉන් අනතුරුව වර්තමාන වගඋත්තරකාර සමාගමට මෙම ආයතනයට පැවරුණ බව ද සාක්ෂිකරු සඳහන් කර තිබිණි. මෙම සමාගම සාමූහික ගිවිසුම්වලට එළඹ තිබූ බව ද එකී ගිවිසුම් R8, R9, R10, R11 වශයෙන් ද ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණි.

ඉහත සාමූහික ගිවිසුම් මගින් ප්‍රසාද දීමනා ගෙවීම සම්බන්ධව කිසිඳු සඳහනක් නොමැති බව ද මෙම සාක්ෂිකරු සඳහන් කර තිබිණි. ඉහත ප්‍රසාද දීමනාව ගෙවීම සම්බන්ධව සමාගම එකගතාවයක් නොවූ බව ද තම සමාගම 2009, 2010, 2011 ලාභ නොලැබූ බව ද එසේ වුව ද විශේෂ දීමනාවක් ගෙවා තිබෙන බව ද 2009 සිට ප්‍රසාද දීමනාව ගෙවීම සම්බන්ධව ක්‍රමවේදයක් නොතිබූ බව ද කළමනාකාරිත්වයේ අභිමතය පරිදි ඉහත දීමනාව ගෙවූ බව ද මෙම සාක්ෂිකරු සඳහන් කර තිබිණ.

ඉහත සාක්ෂිකරු සාක්ෂියට කැඳවීමෙන් අනතුරුව මයුරනාත් දම්මික ලොකුවිතාන සමාගමේ අධ්‍යක්ෂවරයා සාක්ෂියට කැඳවූ අතර ඔහු සිය මූලික සාක්ෂිය දිවුරුම් ප්‍රකාශයක් මගින් ලබාදෙන ලදී.

ඉහත සාක්ෂිකරු සිය කරුණු ඉදිරිපත් කරමින් කොරියන් සමාගම යටතේ තිබූ මෙම සමාගම 2009.11.25 දින ලබාගත් බව ද ඒ වන විට ආයතනය පාඩු ලබමින් සිටි බව ද එම හේතුව මත ආයතනය නගා සිටුවීම සඳහා කටයුතු කරමින් ඩොලර් මිලියන් 80 යෙදවූ බව ද, ඒ අනුව නව තාක්ෂණය යොදා ගත් බව ද, ආයතනයේ නිෂ්පාදනය පුළුල් කළ බව ද, මිනිස් ශ්‍රමය අඩුකොට ස්වයංක්‍රීයව නිෂ්පාදන ක්‍රියාවලියකට යොමු කළ බව ද, එසේ වුවද, සේවකයින් ඉවත් නොකළ බව ද, මෙම සාක්ෂිකරු සිය කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර තිබිණ. මෙම කාලය වන විට යකඩ ක්ෂේත්‍රයේ ආයතන 23 ක් පමණ යෙදී සිටි බව ද, එම සමාගම සමග තරග කරමින් මෙම ආයතනය වැඩි දියුණු කළ බව ද මෙම සාක්ෂිකරු සඳහන් කර තිබිණි.

තවද, මෙම සමාගම සාමූහික ගිවිසුම් ඇති කර ගත් බව ද, ඊට අදාළ එකී ගිවිසුම්වල පිටපත් ද, R1, R10, R11, R29 වශයෙන් ද ලකුණුකොට ඉදිරිපත් කර තිබිණි.

ඉල්ලුම්කාර පාර්ශවය සඳහන් කරන ලද A4 ගිවිසුමේ සඳහන් A4(a) වශයෙන් සඳහන්ව ඇති පරිදි ප්‍රසාද මුදල් ගෙවීමට තම සමාගම එකඟ නොවූ බව ද, දෙවන පාර්ශවය සිය කරුණු ඉදිරිපත් කරමින් සඳහන් කර තිබිණි.

දෙවන පාර්ශවය ඉහත සාක්ෂිකරු සාක්ෂියට කැඳවීමෙන් අනතුරුව සාක්ෂි මෙහෙයවීම අවසන්කොට ලකුණු කරන ලද R1 සිට R64 දක්වා ලේඛන සමග ලිඛිත සැළකිරීම් බේරුම්කරණයට භාරදෙන ලදී. පළමු පාර්ශවය ද සිය සාක්ෂි මෙහෙයවීම අවසන් කර තිබූ අතර එම පාර්ශවය ද ලකුණු කරන ලද A1 සිට A22 දක්වා ලේඛන සමග ලිඛිත සැළකිරීම් බේරුම්කරණයට භාර දෙන ලදී.

බේරුම්කරණයට ඉදිරිපත් කර ඇති කාර්මික ආරවුල මෙසේය,

"සිලෝන් ස්ටීල් කෝපරේෂන් ලිමිටඩ් විසින් මේ සමග අමුණා ඇති උපලේඛනයේ නම් සඳහන් ආර්. ඩබ්. නිමල් ජයසිරි මහතා ඇතුළු සේවකයින් 181 දෙනෙකු වෙත 2009 වසරේ සිට වාර්ෂික ප්‍රසාද මුදල් නොගෙවීමෙන් ඔවුන්ට යම් අසාධාරණයක් සිදු වී ඇත්ද, එසේ සිදු වී ඇත්නම් ඔවුන් වෙත ලැබිය යුතු සහන කවරේද" යන්න වේ.

මූලික විරෝධතාවයට නියෝගයක් ලබාදෙමින් දෙවන පාර්ශවයට එකී විරෝධතාවය මත සාක්ෂි මෙහෙයවන ලෙස නියම කර තිබියදී සාමාන්‍ය පරිදි පළමු පාර්ශවයට සාක්ෂි මෙහෙයවන ලෙස කරන ලද ඉල්ලීම හා ඊට පළමු පාර්ශවය එකඟවීම මත ප්‍රථම පාර්ශවය සාක්ෂි මෙහෙයවීම ආරම්භ කර තිබිණි.

ඉල්ලුම්කාර පාර්ශවය තම කරුණු ඉදිරිපත් කරමින් ආයතනය මුල් අවස්ථාවේදී රාජ්‍ය සංස්ථාවක් බව ද, පසුව සමාගමක් බවට පත්කොට කොරියා හෙවි ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් කොන්ස්ට්‍රක්ෂන් (KOREA HEAVY INDUSTRIES AND CONSTRUCTION CO. LTD) සමාගමට පැවරූ බව ද, එම අවස්ථාවේදී ගිවිසුම්ගතව ප්‍රසාද මුදල් ගෙවීමට එකඟ වී සිටි බව ද, ඊට අදාළ ලේඛනය A4-A4(a) වශයෙන් ලකුණුකොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණි.

ඉහත කොරියන් සමාගම මෙම ප්‍රසාද දීමනාව නිසි ලෙස ගෙවූ බව ද, වර්තමාන සමාගම ඉහත ප්‍රසාද මුදල් නොගෙවූ බව ද, ඒ අනුව එකී ප්‍රසාද දීමනාව ලබාදෙන ලෙස ප්‍රථම පාර්ශවය බේරුම්කරණයෙන් අයැද තිබිණ.

වගඋත්තරකරු හෙවත් දෙවන පාර්ශවය කරුණ ඉදිරිපත් කරමින් ඉහත පරිදි ප්‍රසාද දීමනාව ගෙවීමට තම සමාගම බැඳී නැති බව ද සමාගමේ සියලුම සේවකයින්ට විශේෂ දීමනාවක් ගෙවූ බව සඳහන් කර තිබිණි.

ප්‍රථම පාර්ශවය හෙවත් ඉල්ලුම්කාර පාර්ශවය ද කරුණු දක්වමින් A4 ලේඛනයේ A4(a) වශයෙන් සඳහන් ආකාරයට ප්‍රසාද ගෙවීමට මෙම සේවා යෝජකයා ද බැඳී සිටින බව ද, ඉහත A4(a) පරිදි ගෙවීම තුළින් වැඩි මුදලක් තමන්ට හිමිවන බව ද සඳහන් කර තිබිණ. මෙම කරුණ තහවුරු කිරීම සඳහා බේරුම්කරණයේ සාක්ෂියට කැඳවන එම්. ඒ. සුනිල් නමැති සේවකයාගේ වැටුප් ලේඛන කිහිපයක් A12(j), A12(k), A12(n), A12(p), A12(q) වශයෙන් ද ලකුණුකොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ. ඉහත වැටුප් ලේඛනවල අංක 24 යටතේ මෙම දීමනාව සටහන් වන බව ද ඉල්ලුම්කාර පාර්ශවය සඳහන් කර තිබිණි.

A4 ලේඛනයේ A4(a) යටතේ ප්‍රසාද මුදල් ගණනය කිරීම තුළින් සේවකයන්ට වැඩි මුදලක් ලැබී තිබූ බව පිළිගත හැකිය.

ඉහත ලේඛනයේ සඳහන් ක්‍රමවේදයට තම සමාගම එකඟ නොවූ බව ද ඒ අනුව විශේෂ දීමනාවක් ගෙවූ බව ද වගඋත්තරකරු සඳහන් කර තිබිණ. ඉහත දීමනාව බේරුම්කරණයට කැඳවූ ඉල්ලුම්කරුවන් දෙදෙනාම ලබාගෙන තිබූ බව පිළිගෙන තිබිණ. එසේම මෙම ඉල්ලුම්කරුවන් 181 දෙනා ඉහත දීමනාව ලබානොගත් බවට ද කිසිදු සාක්ෂියක් ඉදිරිපත් කර නොතිබුණි.

ඉහත A4(a) පරිදි ප්‍රසාද මුදල් නොලැබීම හේතුකොට ගෙන ඉහත වෘත්තීය සමිති කම්කරු දෙපාර්තමේන්තුවට කරන ලද පැමිණිල්ලක් මත පරීක්ෂණයක් පවත්වා තිබූ බව ද මේ අනුව ඉහත ප්‍රසාද මුදල ලබාදෙන ලෙස දෙවන පාර්ශවයට දැනුම් දී ඇති බව ද සඳහන් කර තිබිණි. සමාගමේ මානව සම්පත් කළමනාකාරිය ඊට එකඟත්වය පළ කර තිබෙන බව ද 2011.01.04 දිනැති A8 ලිපිය බේරුම්කරණයට ඉදිරිපත් කරමින් සඳහන් කර තිබුණි. ඉහත බේරුම්කරණයේ දී මෙම ලිපිය වගඋත්තරකරු ප්‍රතික්ෂේපකොට තිබූ අතර ඒ අනුව ඊට තම සමාගම වග නොකියන බවට ද කරුණු ඉදිරිපත් කර තිබිණ. A8 ලිපිය පරිදි වාර්ෂික ප්‍රසාද දීමනා ගෙවීමේ ක්‍රමවේදයට අනුව යම් ගෙවීමක් ඇත්නම් ගිණුම් වාර්තා නිකුත් කිරීමෙන් අනතුරුව මෙකී දීමනාව සමාලෝචනය කොට ගෙවීමක් ඇත්නම් ඒ අනුව පාලන අධිකාරිය කටයුතු කරන බව ඉහත ලිපියේ සඳහන්ව ඇත. A8 ලිපිය වගඋත්තරකාර පාර්ශවය බේරුම්කරණයේදී ප්‍රතික්ෂේප කළ අතර එසේ වුවද මෙම ලිපියේ නිකුත් කළ මානව සම්පත් කළමනාකාරිය බේරුම්කරණය ඉදිරියේ වගඋත්තරකරු නියෝජනය කරමින් පෙනී සිට තිබූ බව ද තහවුරු විය. එම ලිපිය නිකුත් කළ දිනයට ආසන්න කාලයක දී හෝ මෙම ලිපියට විරෝධතාවයක් ද සේවායෝජක දක්වා තිබූ බවට ද කරුණු ඉදිරිපත් නොවුණි.

කම්කරු දෙපාර්තමේන්තුවට කරන ලද පැමිණිල්ලක් මත 2009.11.09 දින කම්කරු දෙපාර්තමේන්තුවෙන් නිකුත් කරන ලද කාර්ය සටහනක් A6 වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර ඇත. A6 ලිපියේ කාර්ය සටහන් පරිදි දෙපාර්ශවය සාකච්ඡා කර ප්‍රශ්න විසඳාගන්නා ලෙස දැනුම් දී තිබෙන බව ද ඉහත ලේඛනයේ අවසන් ඡේදයේ සටහන අනුව අනාවරණය වේ.

ඉල්ලුම්කාර පාර්ශවය 2012.08.22 කරන ලද පැමිණිල්ලක් මත පරීක්ෂණයකින් අනතුරුව නියෝජ්‍ය කම්කරු කොමසාරිස් (කාර්මික සම්බන්ධතා) විසින් 2012.10.08 දින පවත්වන පරීක්ෂණයකින් අනතුරුව ලිපියක් යවා ඇති අතර එම ලිපිය ඉල්ලුම්කාර පාර්ශවය A9 වශයෙන් ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ.

එම ලිපිය මගින් භුක්ති විඳි වරප්‍රසාද හා සේවා කොන්දේසි අඩු නොකරන ලෙස සේවා යෝජකයාට දැනුම්දීමක් කර නැත.

ඉහත ලිපිය යැවීමට පදනම් වූ කරුණු කම්කරු දෙපාර්තමේන්තුවේ නිලධාරියෙකු හෝ කැඳවා තහවුරු කිරීමට ද ඉල්ලුම්කාර පාර්ශවය අපොහොසත් විය.

ඉහත ලිපියේ භුක්ති විඳි වරප්‍රසාද යනුවෙන් සඳහන්ව ඇතත් ඒවා වෙන් වෙන්ව සඳහන්කොට එම ලිපිය යවා නොමැති බව ද පිළිගත හැකිය. ඉහත ලිපිය යැවීමට පදනම් වූ කරුණු බේරුම්කරණයට ඉදිරිපත් නොවුණි.

ඉල්ලුම්කාර පාර්ශවය මෙම ප්‍රසාද දීමනාව ගෙවීමට ගිවිසුම්ගතව බැඳී සිටින බව ද, එකී ගිවිසුම A4 වශයෙන් ද ලකුණුකොට බේරුම්කරණයට ඉදිරිපත් කළ අතර වගඋත්තරකරු ද අදාළ ගිවිසුම R33 වශයෙන් ද ලකුණුකොට තිබිණ.

ඉහත ගිවිසුම පරිදි ප්‍රසාද මුදල් ගෙවිය යුතු ආකාරය දැක්වෙන බව ද, කොරියන් සමාගම ඊට අදාළව ගෙවූ බව ද, මෙම වගඋත්තරකාර සමාගම ලබාගත් දිනයෙන් පසුව නොගෙවූ බවට ඉල්ලුම්කාර පාර්ශවය සඳහන් කළ කරුණු බේරුම්කරණයේ දී ඉදිරිපත් වූ සාක්ෂි අනුව පිළිගත හැකිය.

දෙවන පාර්ශවය කරුණු දක්වමින් ඉහත ගිවිසුමට තම සමාගම බැඳී නොසිටි බවද, එම ගිවිසුමට තම සමාගම පාර්ශවකරුවෙක් නොවූ බව ද, සිය කරුණු ඉදිරිපත්කරමින් සඳහන් කර තිබිණි. A4 ගිවිසුම් රජය හා කොරියා හෙවි ඉන්ඩස්ට්‍රීස් සමාගම සමග ඇති වූ ගිවිසුමක් බව බේරුම්කරණයේ දී තහවුරු විය.

ඉහත A4 ගිවිසුම පරිදි අයිතිය වෙනස්වන විටකදී A4(a) යටතේ දැක්වෙන ක්‍රමවේදය මත ප්‍රසාද මුදල් ගෙවිය යුතු බවට සඳහනක් ගිවිසුමේ තිබූ බවට කරුණු ඉදිරිපත් නොවුණි.

ඉල්ලුම්කාර පාර්ශවය කාලයක් තුළ භුක්ති විඳි වරප්‍රසාදයක් බව ද ඒ අනුව වර්තමාන සමාගම ද ඒ අනුව ගෙවීමට බැඳී සිටින බව ඉල්ලුම්කාර පාර්ශවය සඳහන් කර තිබිණි.

A4 ගිවිසුමේ A4(a) වශයෙන් දැක්වෙන වගන්තිය පරිදි වර්තමාන සමාගමේ සියලුම සේවකයින් පෙර සමාගම යටතේ ප්‍රසාද මුදල් ගෙන තිබූ බව තහවුරු විය. එකී මුදල කලක් භුක්ති විඳීම හේතුකොට ගෙන වරප්‍රසාදයක් වූ බැවින් එම ගෙවීමට බැඳී ඇති බව පළමු පාර්ශවය සඳහන් කර තිබිණ. වගඋත්තරකරු එම ස්ථාවරය ප්‍රතික්ෂේපකොට තිබිණ.

ප්‍රසාද දීමනාව යනු ලාභය මත පදනම්ව සේවායෝජකගේ කැමැත්ත ඇතිව ගෙවනු ලබන දීමනාවක් බව ද, කුන්ඩන්මාල්ස් ඉන්ඩස්ට්‍රීස් එදිරිව කම්කරු කොමසාරිස් සහ තවත් අය යන නඩුවේ කරුණු දක්වමින් දෙපාර්ශවය සඳහන් කර ඇත. ඉල්ලුම්කාර පාර්ශවය ඉහත තීන්දුව ඉදිරිපත් කරමින් ගිවිසුම්ගතව එම මුදල ගෙවීමට බැඳී සිටින අවස්ථාවක ගෙවිය යුතු බවට ඉහත තීන්දුවේ සඳහන්ව ඇති බව සඳහන් කර තිබිණ. වර්තමාන වගඋත්තරකරු හා ඉල්ලුම්කාර පාර්ශවය අතර ගිවිසුම්ගතව බැඳීමක් තිබූ බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරු නොවුණි.

වගඋත්තරකාර සමාගමේ සේවය කරන ලද වෘත්තීය සමිති දෙකක සේවකයින් 181 දෙනෙක් මෙම ඉල්ලීම බේරුම්කරණයට ඉදිරිපත් කර ඇත. ඉහත සේවකයින්ට අදාළ වැටුප් පිළිබඳව විස්තර සේවා කාලය, විශ්‍රාම ගොස් ඇත්නම් ඒ පිළිබඳව විස්තර කිසිවක් බේරුම්කරණයට ඉදිරිපත් කර නැත.

එම්. ඒ. සුනිල් නැමැති සේවකයා සාක්ෂියට කැඳවීම හේතුකොට ගෙන ඔහු 2014 දී විශ්‍රාම ගිය බව සඳහන් කර තිබිණ. සේවකයින් අතරින් විශ්‍රාම ගිය සේවකයන්ගේ හා දැනට සේවයේ යෙදී සිටින සේවකයින් පිළිබඳව විස්තරයක් ද බේරුම්කරණයට ඉදිරිපත්ව නැත.

ඉල්ලුම්කාර පාර්ශවය ඉල්ලුම්කරුවන්ගේ වැටුප් විස්තර ඉදිරිපත් කිරීමට ද අපොහොසත් විය. ඉහත සේවකයින්ගේ වැටුප ඉල්ලුම්කාර පාර්ශවය සඳහන් කළ පරිදි A4 (a) ක්‍රමවේදයට අත්‍යවශ්‍ය සාධකයකි. ඉල්ලුම්කරුවන් 181 දෙනෙක් මෙම ඉල්ලීම කර ඇති අතර ඔවුන්ගේ නම් පමණක් ඇති හෙයින් ඉහත විස්තර ඉදිරිපත් කිරීම ඉල්ලුම්කාර පාර්ශවයේ වගකීමය.

ඉල්ලුම්කාර පළමු පාර්ශවය ලිඛිත සැල කිරීම් ඉදිරිපත් කරමින් එහි අවසාන ඡේදයේ වැටුප් විස්තර ඉදිරිපත් කරමින් සහය දැක්විය හැකි බව ප්‍රකාශ කළ ද එම තොරතුරු ලබාදිය යුත්තේ බේරුම්කරණයට සාක්ෂි මගිනි. එසේ ඉදිරිපත් කළ විට අනෙක් පාර්ශවය ද කරුණු දැක්වීමට අවස්ථාවක් ද ලැබෙනු ඇත. දෙපාර්ශවය සිය සාක්ෂි මෙහෙය වීම අවසන් කර තිබියදී වෙනත් තොරතුරු පසුව ලබා ගැනීමේ හැකියාවක් ද නැත.

ඉල්ලුම්කාර පාර්ශවය සඳහන් කළ ගිවිසුම A4 වශයෙන් ද වගඋත්තරකරු එම ගිවිසුම R33 වශයෙන් ද ලකුණු කොට බේරුම්කරණයට ඉදිරිපත් කර තිබිණ. A4 ගිවිසුම අත්සන් කර ඇත්තේ රජය හා කොරියා හෙවී ඉන්ඩස්ට්‍රීස් ඇන්ඩ් කන්ස්ට්‍රක්ෂන් සමාගම සමග ය. (KOREA HEAVY INDUSTRIES AND CONSTRUCTION CO.LTD) ඉහත ගිවිසුම පරිදි පසු අවස්ථාවක දී නව සමාගමක් මෙම ගිවිසුමෙන් බැඳී සිටින බවට ද සාක්ෂි ඉදිරිපත් නොවුණි. A4 ගිවිසුම පරිදි රජය එක් පාර්ශවයක් වී ඇති අතර මෙම සමාගම ඉහත ගිවිසුමට බැඳී සිටි බවට කරුණු තහවුරු නොවුණි. A4 (a) ගිවිසුම පරිදි ඉහත වග උත්තරකාර සමාගම බැඳී සිටින බවට ගිවිසුම අත්සන් කළ රජයේ පාර්ශවයෙන් සාක්ෂිකරුවෙකු කැඳවා තහවුරු කිරීමට ඉල්ලුම්කාර පාර්ශවය අපොහොසත් විය.

වගඋත්තරකාර සමාගම 2009, 2010, 2011 පාඩු ලැබූ බව සඳහන් කළ අතර ඉල්ලුම්කාර පාර්ශවය ද එම කරුණු පිළිගෙන තිබිණ. පාඩු ලබන විටෙක ගෙවිය යුතු ප්‍රසාද දීමනාව A4 (a) හි සඳහන්ව ඇත.

මෙම වගඋත්තරකාර ඉහත සමාගම 2009.11.25 දින මෙකී සමාගම ලබාගෙන තිබූ බව සඳහන් කළ අතර ඒ අනුව 2010 වර්ෂයේ දී ප්‍රථම වරට සේවකයින්ට රු. 8000/- ක විශේෂ දීමනාවක් ලෙස ගෙවා තිබූ බව තහවුරු විය. ඉන් අනතුරුව 2011 වර්ෂයට රු. 10,000/- ක් ගෙවා තිබූ බව ද 2012 වර්ෂයේ දී රු. 13,000/- ක් ද ගෙවා තිබූ බව R2, R3, R4 ලේඛන අනුව අනාවරණය වේ.

දෙපාර්ශවය සිය ලිඛිත සැළකිරීම් ඉදිරිපත් කරමින් කුන්ඩන්මාල්ස් ඉන්ඩස්ට්‍රීස් එදිරිව කම්කරු කොමසාරිස් සහ තවත් අය යන නඩුව පිළිබඳ කරුණු බේරුම්කරණය ඉදිරිපත් කර තිබුණි.

වගඋත්තරකාර සමාගම කරුණු දක්වමින් ලාභයක් ලබන විටෙක සේවායෝජකගේ කැමැත්ත පරිදි ප්‍රසාද මුදල් ගෙවන බව සඳහන් කර තිබුණි. එම නඩුවේම ගිවිසුම්ගත බැඳීමක් තිබෙන විටෙක එම ගිවිසුම පරිදි ප්‍රසාද දීමනාව ගෙවිය යුතු බව ද සඳහන් කර තිබෙන බව පිළිගත හැකිය.

වගඋත්තරකාර සමාගම හා ඉල්ලුම්කාර වෘත්තීය සමිතිය සමග හෝ ඉල්ලුම්කාර පාර්ශවය සමග එවැනි ගිවිසුමක් තිබූ බව බේරුම්කරණයට ඉදිරිපත් වූ සාක්ෂි අනුව තහවුරු නොවුණි.

වගඋත්තරකාර සමාගම ආයතනය භාර ගැනීමෙන් පසුව සමාගම වැඩි දියුණු කළ බව ද නව යන්ත්‍ර සූත්‍ර සවි කළ බව ද ඒ අනුව මිනිස් ශ්‍රමය අඩුකොට යාන්ත්‍රිකව නිෂ්පාදනය වැඩි කළ බවට ඉදිරිපත් කළ කරුණු ඉල්ලුම්කාර පාර්ශවය ප්‍රතික්ෂේපකොට නොතිබුණි.

2013 වර්ෂය වන විට A4 (a) ක්‍රමවේදය අනුව ප්‍රසාද මුදල් නොගෙවීම සම්බන්ධව ඉල්ලුම්කරුවන් ඇතුළු සේවකයින් දැන සිටි බව ද පිළිගත හැකිය. 2013 සාමුහික ගිවිසුමක් වෘත්තීය සමිතිය සමග අත්සන් කර තිබෙන බව ද තහවුරු විය. ඉල්ලුම්කාර වෘත්තීය සමිතිය එකී ගිවිසුම අත්සන් කර නැති බව සඳහන් කළ ද අනෙකුත් සේවකයින් ඉහත පරිදි ප්‍රසාද මුදල් නොගෙවීම සම්බන්ධව පියවරක් ගෙන නොමැති බව ද පිළිගත හැකිය.

ඉහත සඳහන් සියලුම සාක්ෂි සැලකිල්ලට ගැනීමෙන් අනතුරුව වගඋත්තරකාර සමාගම A4 ගිවිසුමේ සඳහන්ව ඇති A4 (a) ක්‍රමවේදයට ප්‍රසාද මුදල් ගෙවීමට බැඳී නොමැති බව ද ඉදිරිපත් වූ සියලුම සාක්ෂි අනුව මම නිගමනය කරමි.

ඒ අනුව ඉල්ලුම්කාර වෘත්තීය සමිති ඉල්ලා ඇති සහනය ලබා දිය නොහැකි බැවින් ප්‍රදානයක් නොකරමි.

මෙය සාධාරණ හා යුක්ති සහගත තීරණයක් වන හෙයින් මෙසේ ප්‍රකාශයට පත් කරමි.

2020, සැප්තැම්බර් මස 11 වැනි දින.

බේරුම්කරු
(පාලිත වීරසේකර)

01 - 34

මගේ අංකය: IR/COM/03/2018/73.

### කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය

131 වන අධිකාරිය වන සංශෝධිත කාර්මික ආරාවුල් පනතේ 4(1) වගන්තිය යටතේ 2019.06.03 දිනැති හා අංක 2126/8 දරන *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධ කරන ලද 2019.05.28 දින දරන නියෝගයෙන්, එක් පාර්ශ්වයක් වශයෙන් මහරගම, ඇල්හේන පාර, ජයසුන්දර පෙදෙස, අංක 10/21ඒ හි පිහිටි සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය (එම්. ඉම්තියාස් මහතා වෙනුවෙන්) සහ කොළඹ 05, කිරුළ පාර, අංක 200හි පිහිටි ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය අතර පවත්නා කාර්මික ආරාවුල බේරුම්කිරීමෙන් සමථයකට පත්කිරීම සඳහා යොමු කරන ලදුව, බේරුම්කරු විසින් මා වෙත එවා ඇති 2020.09.15 දිනැති ප්‍රදානය එම පනතේ 18(1) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ඔක්තෝබර් මස 16 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

යොමු අංකය: IR/COM/03/2018/73.

කොළඹ කාර්මික අධිකරණයේ දී ය

නඩු අංකය: A/58/2019

සමස්ත ලංකා මෝටර් සේවක සමිතිය,
අංක 10/21 ඒ,
ජයසුන්දර පෙදෙස,
ඇල්හේන පාර,
මහරගම.
(එම්. ඉම්තියාස් මහතා වෙනුවෙන්)

*ඉල්ලුම්කරු*

*එදිරිව,*

ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලය,
අංක 200, කිරුළ පාර,
කොළඹ 05.

*වග උත්තරකරු*

කම්කරු හා වෘත්තීය සමිති සබඳතා අමාත්‍ය රවීන්ද්‍ර සමරවීර මැතිතුමා විසින් 1957 අංක 14 හා 1957 අංක 62 හා 1962 අංක 4 හා 1968 අංක 39 (1968 අංක 37 දරන කාර්මික ආරවුල් (විශේෂ ප්‍රතිපාදන පනත සමඟ කියවා) දරන පනත්වලින් සංශෝධිත වූ ලංකාවේ ව්‍යවස්ථාපිත අණපනත්වල 131 වන පරිච්ඡේදය (1956 ප්‍රතිශෝධිත මුද්‍රණය) වන කාර්මික ආරාවුල් පනතේ 4(1) වන වගන්තියෙන් ඔහු වෙත පැවරී ඇති බලතල අනුව, එකී ආරවුල බේරුම් කිරීමෙන් නිරවුල් කිරීම සඳහා 2018.02.24 දින දිනැති නියෝගයෙන් බේරුම්කරුවෙකු වශයෙන් මහනුවර, කටුගස්තොට, ගොහාගොඩ පාර, අංක 599 පදිංචි එච්. එම්. අනුලාවතී වන මා 2019.05.28 දින පත්කොට මෙම ආරාවුල මා වෙත යොමුකර ඇත.

*ආරාවුලට තුඩු දුන් කාරණය* :

බේරුම්කරණය සඳහා මා වෙත යොමුකර ඇති උක්ත නියෝගය ප්‍රකාරව ඉහත සඳහන් දෙපාර්ශවය අතර උද්ගත වී ඇති කාර්මික ආරාවුලට හේතුවී පවත්නා කරුණු වූයේ,

"2016.01.12 දින සිදුවී ඇති රිය අනතුරකට අදාළව පවත්වා ඇති විනය පරීක්ෂණයෙන් ශ්‍රී ලංකා ගමනාගමන මණ්ඩලයේ මීතොටමුල්ල ඩිපෝවේ වැඩ මූලික ලෙස සේවය කර ඇති එම්. ඉම්තියාස් මහතාට ලබාදී ඇති විනය නියෝගයෙන් / දඬුවමෙන් ඒ මහතාට අසාධාරණයක් සිදුවී තිබේ ද? අසාධාරණයක් සිදුවී ඇත්නම් හිමිවිය යුතු සහන කවරේ ද? යන්න පිළිබඳව වේ."

ඒ අනුව පාර්ශවයන් අතර පවත්නා කාර්මික ආරාවුල සම්බන්ධයෙන් දෙපාර්ශවය වෙතින්ම ලිඛිත කරුණු දැක්වීමෙන් අනතුරුව නඩුව විභාගයට ගැනීමට තීරණය කරන ලදී. එහිදී පැමිණිලිකාර පාර්ශවය සමත යෝජනාවක් ඉදිරිපත් කළ අතර, ඊට වග උත්තරකාර පාර්ශවය ප්‍රතිචාර දැක්වීම ප්‍රමාද වූයෙන් නඩුව අඛණ්ඩව විභාගයට ගන්නා ලදී. කෙසේ වුවද නඩුව විභාගයට ගන්නා අතරතුර 2020.08.20 දින වග උත්තරකාර පාර්ශවය කරුණු දක්වමින් මෙම නඩුවේ පූර්ණ සහ අවසාන සමතයක් ලෙස රුපියල් විසි එක් දහසක් (රු. 21,000) ඉල්ලුම්කරුට ගෙවීමට වග උත්තරකරු එකගවේ. තවද මෙම සමථය වෙනත් නඩුවක් සඳහා පූර්වාදර්ශයක් නොවන බවට කොන්දේසියකට යටත්ව මෙම සමතයට එළඹෙන බව ප්‍රකාශ කර සිටී. ඉල්ලුම්කාර පාර්ශවය එකී සමතයට සිය එකඟතාවය ප්‍රකාශ කර සිටින ලදී. තවද දෙපාර්ශවයේ එකඟතාවය මත එකී සමථයට අදාළ මුදල වන රු. 21,000 මුදල වග උත්තරකාර පාර්ශවය විසින් අංක 061822 සහ 2020.08.05 දිනැති චෙක්පත මගින් 2020.08.26 දින අධිකරණය ඉදිරියේ ඉල්ලුම්කරුට ගෙවීමෙන් නඩුව අවසන් කරන ලදී.

එහෙයින් මෙම සමථය සාධාරණ වූත් යුක්ති සහගත වූත් එකක් බව තීරණය කරමි.

2020 සැප්තැම්බර් මස 15 දින දී ය.

එච්. එම්. අනුලාවතී.
බේරුම්කරු.

01 - 35

---

මගේ අංකය: IR/COM/05/A/2015/180.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

අංක 2160/37 දරන හා 2020.01.30 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් බලල්ල, බලගොල්ලාගම හි පදිංචි එස්. පී. අනෝමා ශ්‍යාමලී කුමාරි මිය ඇතුළු සේවක පිරිස හා අනෙක් පාර්ශවය වශයෙන් කොළඹ 07, බෞද්ධාලෝක මාවත, අංක 212/1 හි පිහිටි මධ්‍යම සංස්කෘතික අරමුදල අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 44/2017 දරන 2019.11.29 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් මධ්‍යම සංස්කෘතික අරමුදල වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 44/2017 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2021.01.30 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 සැප්තැම්බර් මස 11 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

**පළමුවන උපලේඛනය**

''අ'' ආකෘති පත්‍රය

(3 වන නියෝගය)

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත

**බේරුම්කරුවෙකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

ලිපිනය: මධ්‍යම සංස්කෘතික අරමුදල

දිනය: 2020.06.01

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය,

2020.01.30 දිනැති අංක 2160/37 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ ද පළමු පාර්ශවයේ සහ දෙවන පාර්ශවයේ බැඳී සිටින්නා වූ ද 2019.11.29 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

අධ්‍යක්ෂ ජනරාල්,
මධ්‍යම සංස්කෘතික අරමුදල,
අදියර II, හතරවන මහල,
සෙත්සිරිපාය,
බත්තරමුල්ල.

පිටපත : එස්. පී. අනෝමා ශ්‍යාමලී කුමාරි මිය.
බලගොල්ලාගම, බලල්ල. (අ.ක.ස.දූ.ගැ.පි.)

1. ප්‍රතික්ෂේප කරන පාර්ශවය, වෘත්තීය සමිතිය, සේවායෝජකයා හෝ සේවකයා විසින් අවස්ථාවෝචිත පරිදි තීරණයෙන් බැඳී සිටින අනෙකුත් සෑම පාර්ශවයකටම, වෘත්තීය සමිතියකට සේවායෝජකයෙකුට සහ සේවකයෙකුටම වෙන වෙනම දැන්වීම යැවිය යුතුය. (පනතේ 9(1), 15(1) හා 20(1) වන වගන්තිය බලන්න.)

2. දැන්වීම අත්සන් කරන තැනැත්තා එය අත්සන් කරන්නේ වෙනත් යම් පාර්ශවයක්, සේවායෝජකයකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් නම් ඒ තැනැත්තා එය අත්සන් කරන්නේ කවර පාර්ශවයක් සේවායෝජකයෙකු, වෘත්තීය සමිතියක් හෝ සේවකයෙකු වෙනුවෙන් ද යන වග වෘත්තීය සමිතියක් සම්බන්ධයෙන් වන විට ඔහු ඒ වෘත්තීය සමිතියේ දරන තනතුර ද නිශ්චිතව සඳහන් කළ යුතුයි.

මගේ අංකය: IR/10/84/2013.

**කාර්මික ආරාවුල් පනත - 131 වන අධිකාරිය**

අංක 2188/37 දරන හා 2020.08.13 දිනැති *ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අතිවිශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රසිද්ධියට පත් කරනු ලැබූ එක් පාර්ශවයක් වශයෙන් පන්නිපිටිය, කොට්ටාව, රුක්මල්ගම නිවාස යෝජනා ක්‍රමය, අංක 22බී/4 හි පදිංචි එම්. ඩබ්. ඒ. එස්. බී. රඹුක්වැල්ල මයා හා අනෙක් පාර්ශවය වශයෙන් මොරටුව, කටුබැද්ද, ගාලු පාර, අංක 615 හි පිහිටි ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය අතර පැවති කාර්මික ආරාවුල සම්බන්ධයෙන් බේරුම්කරු විසින් ලබා දී ඇති අංක A 3666 දරන 2020.04.15 දිනැති ප්‍රදානය ප්‍රතික්ෂේප කරන බව දන්වමින් මධ්‍යම සංස්කෘතික අරමුදල වෙතින් කාර්මික ආරාවුල් පනතේ 20(1) යටතේ නිවේදනයක් මා වෙත ලැබී ඇත.

එහෙයින් අංක A 3666 දරන බේරුම්කාර ප්‍රදානය ක්‍රියාත්මක වීම 2021.08.13 දින සිට අවසන් වන බවට පනතේ 20(2)(ආ) වගන්තිය යටතේ මෙයින් ප්‍රකාශයට පත් කරනු ලැබේ.

ඒ. විමලවීර,
කම්කරු කොමසාරිස් ජනරාල්.

2020 ඔක්තෝබර් මස 15 වැනි දින,
කම්කරු දෙපාර්තමේන්තුව,
කොළඹ 05.

1950 අංක 43 දරන කාර්මික ආරාවුල් පනත

**බේරුම්කරුවෙකුගේ තීරණයක් ප්‍රතික්ෂේප කිරීමේ දැන්වීම**

අංක 615, ගාලු පාර,
කටුබැද්ද,
මොරටුව.
2020.10.02

කම්කරු කොමසාරිස් ජනරාල් වෙතටය,

2020.08.13 දිනැති අංක 2188/37 දරන ගැසට් පත්‍රයේ පළකරන ලද්දාවූ ද එම්. ඩබ්. ඒ. එස්. බී. රඹුක්වැල්ල සහ ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය බැඳී සිටින්නා වූ ද 2020.04.01 දින දරන බේරුම්කරුගේ තීරණය ප්‍රතික්ෂේප කරන බව මෙයින් දැනුම්දෙනු ලැබේ.

උපසේන දිසානායක,
සභාපති,
ලංකා කාර්මික සංවර්ධන මණ්ඩලය.

පිටපත : එම්. ඩබ්. ඒ. එස්. බී. රඹුක්වැල්ල,
අංක 22බී/4, රුක්මල්ගම නිවාස යෝජනා ක්‍රමය,
කොට්ටාව,
පන්නිපිටිය.

01 - 37

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.